නුවරඑළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂයට සමාන විය යුතු වුවද, එම ගිණුම් ශේෂ අතර රු.21,742 ක වෙනසක් පැවතුණි. | ගිණුම් සසඳා නිවැරදි කරගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු වැය විෂයය යටතේ රු.75,000 ක් ණයහිමි ගිණුමට බැර කර තිබුණ ද, නියමිත ගිණුමට හර සටහනක් ඇතුළත් කර නොතිබූ බැවින් වර්ෂයේ වියදම එම වටිනාකමින් අඩුවෙන් දැක්වෙන අතර ගිණුම් තුලනය වූ ආකාරයද පැහැදිලි නොවීය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දුරකථන ගාස්තු | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | රු.22,000 ක් ණයහිමි ගිණුමට බැර කර තිබුණ ද, ආදාළ වැය විෂයයට රු.97,000 ක් ලෙස රු.75,000 ක් වැඩියෙන් හර කර තිබුණි. | | |
| (iv) | ජ'නල් සටහන් අංක 19 මගින් ගබඩා ණයහිමියන් රු.19,292 ක් සැපයුම් සහ උපකරණ වැය විෂයයට හර කර ගබඩා ණයහිමි ගිණුමට බැර කළ ලෙස සටහන් තබා තිබුණ ද එය 103 වැය විෂයයට හර කර නොතිබූ බැවින් ගිණුම් තුලනය කළ ආකාරය පැහැදිලි නොවීය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | ජ'නල් සටහන් අංක 20 මගින් වර්ෂයේ ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීම් රු.1,066,694 ක් සැපයුම් සහ උපකරණ වැය ගිණුම හර කර අදාළ තොග ගිණුම් බැර කළ ලෙස සටහන් තබා තිබුණද, වැය ගිණුමට රු.409,858 ක් පමණක් හර කර අදාළ තොග ගිණුම් රු.1,066,694 කින් බැර කර තිබුණි. ඒ අනුව වර්ෂයේ වියදම රු.656,836 ක් අඩුවෙන් දැක්වෙන අතර ගිණුම් තුලනය වූ ආකාරයද පැහැදිලි නොකෙරුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | තැන්පතු ගිණුමට බැරකළ යුතු මුද්දර බදු රු.188,469 ක් සහ ජාතිය ගොඩනැගීමේ බදු රු.120,454 ක් ආදායම් වියදම් ගිණුමට බැර කර තිබුණු බැවින් වර්ෂයේ ආදායම රු.308,923 ක් වැඩියෙන් හා ආපසු ගෙවිය යුතු තැන්පතු එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | දෙවන වැඩ සටහනේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික වියදම රු.31,049 ක් ආදායම් වියදම් ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණු බැවින් වර්ෂයේ වියදම එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟ රු.135,200 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ix) | සභාව සතු ට්‍රැක්ටර් ට්‍රේලරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 03 ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛන අතර රු.4,906,650 ක වෙනසක් තිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.122,714,198 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | වටිනාකම තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4. අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | සභාවේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, | | | |

| | | | | |
|---|---|---|---|---|
| | 189 හා 486 | 2014 ජූනි 02 දිනැති රු.100,800 ක් වටිනා අගරු චෙක්පතේ වටිනාකම අයකරගෙන නොතිබුණි. | අගරු චෙක්පත් වටිනාකම මුදලින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත ලිපි යොමුකර ඇති අතර නුවරඑළිය මූල්‍ය අපරාධ අංශය වෙතද පැමිණිලි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>----------- | | | |
| | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව අවසන්වරට සිදුකර තිබුණේ 2009 වර්ෂයේදී ය. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. |
| | 2017 මාර්තු 17 දින දරන මප/පපාකො/2016/3 දරන චක්‍රලේඛය | සභාවේ කඩ කාමර 19 ක් සඳහා 2014 වර්ෂයේදී ආදායම් පරීක්ෂක විසින් සිදුකළ තක්සේරුව මත කුලී අයකරමින් පැවතුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,804,200 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස නවයක කාලය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,308,425 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයේ මාස නවයක කාලච්ඡේදයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,120,380 | 3,856,423 | 4,249,346 | 2,520,467 | | 1,857,520 | 765,847 | 2,838,865 |
| කුලී | 8,391,810 | 4,916,238 | 5,182,790 | 204,713 | ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | 3,413,344 | 3,309,827 | 462,940 |
| බලපත්‍ර ගාස්තු | 5,226,000 | 3,689,100 | 3,689,100 | - | | 4,128,251 | 4,128,251 | - |
| වෙනත් ආදායම් | 11,873,950 | 2,719,834 | 41,980,029 | 3,610 | | 1,763,194 | 1,496,608 | 680,679 |
| | 27,612,140 | 15,181,595 | 55,101,265 | 2,728,790 | | 11,162,309 | 9,700,533 | 3,982,484 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ බිල්කළ වරිපනම් බදු, කඩකුලී සහ ජල ගාස්තු අය කිරීමේ ප්‍රගතිය අසතුටුදායක තත්ත්වයක පැවතුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායමින් විශාල මුදලක් මේ වන විට අය කර ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.2,410,587 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.1,506,000 ක් අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව සභාව ප්‍රමාණවත්ව දැනුවත් වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රදේශයේ ජනතාව සහ ව්‍යාපාරිකයින් විසින් නුවරඑළිය උඩපුස්සැල්ලාව ප්‍රධාන මාර්ගයේ කඳපොළ නගරයට ආසන්නයෙන් මාර්ගයේ පහත බෑවුමට කසළ දමා ගොස් තිබුණු බැවින් පරිසරය අවට දුර්ගන්ධයක් වහනය වෙමින් පැවතුණි. | පරිසරයට හානියක් නොවන අයුරින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් නුවරඑළිය හා කඳපොළ පොලිස් ස්ථාන දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු 14 ක පැවති පුරප්පාඩු 34 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | ආයතනගත තනතුරු 10 ක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇති අතර ඉතිරි පුරප්පාඩු 24 සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බඳවා ගැනීම් සිදුකළ යුතු වේ. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 මැයි සිට 2019 ඔක්තෝබර් දක්වා කාලය තුළ සභාපතිවරයාගේ ගමන් සඳහා දිනකට රු.5000 බැගින් ගෙවීමේ පදනම මත කුලියට ලබාගත් වාහනය වෙනුවෙන් රු.2,730,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව වාහන කුලී ලෙස මසකට රු.150,000 ක් පමණ වැයවන අතර එම මුදල මාසික වාරික වශයෙන් ගෙවා කල්බදු ක්‍රමය යටතේ වාහනයක් මිලදී ගැනීමට කටයුතු කළේ නම් එය වඩාත් වාසිදායක විය හැකි වුවද, ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. | අමාත්‍යාංශය එකඟ වී ඇති වාහනය ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාපතිතුමා සඳහා නිල රථයක් නොමැති බැවින් මහා සභා තීරණයක් අනුව වාහන කුලී මුදල් ගෙවූ අතර පළාත් පාලන අමාත්‍යාංශය මඟින් වාහන ලබාදෙන බව ලිඛිතව දැනුම්දීම අනුව සභා අරමුදලින් වාහනයක් ලබා ගැනීමට කටයුතු නොකරන ලදී. |

3.4 ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සභා අරමුදල් මඟින් ක්‍රියාත්මක කළ කඳපොල කොන්කොඩියා ක්‍රිඩා පිටිය සකස් කිරීමේදී පස් ප්‍රවාහනය කර ඉවත් කිරීම සඳහා රු.138,240 ක මුදලක් ගෙවා තිබුණ ද, එසේ පස් ප්‍රවාහනය කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාපතිතුමාගේ උපදෙස් පරිදි ප්‍රවාහනය සඳහා වෙන්කළ මුදලින් එම මුදල පියවා ගැනීමට හැකිවන පරිදි බිල්පත සකස් කර ඇත. |
| (ආ) | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ ප්‍රතිපාදන මත කඳපොළ කොටස වොලිබෝල් ක්‍රීඩාංගනයේ වැට ගැසීම සහ ආලෝක පහසුකම් සැපයීම යටතේ ක්‍රීඩාංගනය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීමේදී ආරක්ෂිත දැල මීටර් 5 ක් උසට ඉදිකළ යුතු වුවත් දිග මීටර් 27 ක් සඳහා මීටර් 2.5 ක් උසට ද, දිග මීටර් 31 සඳහා මීටර් 3.5 ක් උසට ද ආරක්ෂිත වැට ඉදිකර තිබුණි. | නියමිත ප්‍රමිතියට ඉදිකිරීම් කරගත යුතුවේ. | නියමිත ප්‍රමාණයට වැට ඉදි කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත අවස්ථා කිපයකදීම දැනුවත් කර ඇති අතර දින 14 ක් තුළ ඉහත වැඩ විෂය බිල්පතේ සඳහන් වටිනාකම අනුව ඉදි කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | (i) 2019 වර්ෂය සඳහා මධ්‍යම පළාතට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමත රේටයන් අනුව (B.S.R) මුළු පිරිවැය රුපියල් මිලියන 03 දක්වා වූ කොන්ත්‍රාත් සඳහා වූ රේටයන්ට වඩා රු.මිලියන 03 ඉක්මවූ කොන්ත්‍රාත් සඳහා වූ රේටයන් අඩුවන නමුත් සභාව විසින් මුළු පිරිවැය රු.6,351,346 ක් වූ නානුඔය සභා ගොඩනැගිල්ල අළුත්වැඩියාව පිළිබඳ වූ කර්මාන්තය රු.මිලියන 03 ට වඩා අඩු කොටස් 04 කට කඩා එකම ස්වේච්ඡා සංවිධානයක් වෙත පැවරීම හේතුවෙන් සභා අරමුදලට රු.350,138 ක පාඩුවක් සිදුව තිබුණි. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු කිරීමේදි මෙවැනි අඩුපාඩු නොවන ලෙසට කටයුතු කළ යුතු වේ. | අවශ්‍යතාව අනුව කොටස් වශයෙන් ඉදිකිරීම් සිදුකර ඇත. |
| | (ii) කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට සභාව සමඟ ගිවිසුම්ගත වූ සමිතිය විසින් වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත අතුරු කොන්ත්‍රාත් ලබාදී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව සනාථ කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | (i) අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක වු රුවන්එළිය ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉදිකිරිමේ කර්මාන්තයේ අදියර 02 හි වැඩ විෂය අංක 7 යටතේ බිත්ති කපරාරු කිරීම, පාදම කපරාරුව සහ ගෙබිම කොන්ක්‍රීට් කිරීම සඳහා රු.328,282 ක් ගෙවා තිබුණු අතර අදියර 03 හි වැඩ විෂය අංක 7 යටතේ එම කොටස සඳහාම රු.345,484 ක මුදලක් නැවත ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (ii) ඇස්තමේන්තුවට අනුව ගෙබිමට 75 mm ඝනකමින් යුත් කොන්ක්‍රීට් තට්ටුවක් යෙදිය යුතු වුවත් 50 mm ඝනකමින් යුත් කොන්ක්‍රීට් තට්ටුවක් යොදා තිබුණු අතර ප්‍රසාරණ මූට්ටු යොදා නොතිබිම හේතුවෙන් ගෙබිම පුපුරා ගොස් තිබුණි. | ඇස්තමේන්තුවට අනුව නියමිත ප්‍රමිතියෙන් කර්මාන්තය ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 වර්ෂය සඳහා නානුඔය ගවමස් කඩය ටෙන්ඩර් කිරීමේදී ප්‍රසම්පාදන මූලධර්මයන්ට පටහැනි ලෙස ඉහළම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සභා අරමුදලට රු.1,351,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | අදාළ අලාභය පිළිබඳ පරීක්ෂණයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) ගම්පෙරළිය වැඩසටහන යටතේ නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඉදිකළ පොස්වුඩ් ඉහළ මාර්ගය සඳහා වංචා සහගත ලෙස ලිපි ගොනුවක් සකස් කර සභාවේ නිළධාරීන්ද නොමග යවමින් ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයකුගේ මැදිහත්වීම මත සභා අරමුදලින් රු. 1,481,349 ක් ගෙවා තිබුණි. පසුව අදාළ මුදල අයකරගෙන තිබුණ ද, වගකිව යුතු අය හඳුනාගෙන අවශ්‍ය ඉදිරි පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව විමසා වාර්තා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල සභාපතිවරයා විසින් සභා අරමුදල වෙත ගෙවීම් කර ඇත. |